# ජනාධිපතිවරණ නිරීක්ෂණයට පැෆරල්ගෙන් නිරීක්ෂකයන් 15000ක්

හේරල් සේනාධීර

ජනාධිපතිවරණ නිරීක්ෂණ රාජකාරි කටයුතුවල තම නිරීක්ෂකයන් පහළොස් දහසක් යොදවන බව පැෆරල් සංවිධානය ඊයේ (18දා) කොළඹ පැවැති මාධ්‍ය හමුවකදී පැවසීය.

එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා කියාසිටියේ, විදේශීය නිරීක්ෂකයන් 35 දෙනෙකුද මෙම නිරීක්ෂණ කටයුතු සඳහා සහභාගී වීමට දිවයිනට පැමිණීමට නියමිත බවයි. පූර්ව මැතිවරණ ප්‍රචාරක කාලසීමාව තුළදීත් මේ වනවිට දිවයිනේ විවිධ ප්‍රදේශවල නිරීක්ෂකයන් 335 දෙනෙකු යොදවා ඇතැයි පැවසූ ඒ මහතා, මැතිවරණ නීති පිළිබඳව දැනුවත් නීතිඥ කණ්ඩායමක් යොදවා 15,000 ක් පමණ වන නිරීක්ෂකයන්ට පුහුණුවක් ලබා දී ඇතැයිද සඳහන් කළේය.

මෙවර ජනාධිපතිවරණයේදී ඡන්දය දීමට සුදුසුකම් ලබාඇති පිරිස මිලියන 15 ක් පමණ වන බව පැවසූ රෝහණ හෙට්ටිආරච්චි මහතා, මෙම පිරිස අතරින් ලක්ෂ 04කට පමණ හැඳුනුම්පත් නොමැති බවද සඳහන් කළේය. එමනිසා ජනාධිපතිවරණයට පෙර හැඳුනුම්පත් ලබාගැනීමට උනන්දු වන ලෙසද ඒ මහතා හැඳුනුම්පත් නොමැති ජනතාවගෙන් ඉල්ලීමක් කළේය. මැතිවරණ කාලසීමාව තුළ රාජ්‍ය නිලධාරීන් සහ රාජ්‍ය සම්පත් යොදාගැනීම් බහුලව දක්නට ලැබෙන බවත්, එක් අපේක්ෂකයෙකු පමණක් ප්‍රධාන වශයෙන් මැතිවරණ නීති උල්ලංඝනය කරන බවත් විධායක අධ්‍යක්ෂවරයා තවදුරටත් පැවසුවේය.